# Sri Lanka Tourism

**Sri Lanka Tourism Development Authority, 80, Galle Road, Colombo 03, Sri Lanka.**

Hotline: 1912 Tel: +94 11 2426800/900, Fax: +94 11 2437953 E-mail: info@srilanka.travel, Web: www.srilanka.travel / www.sltda.gov.lk


SLTDA/SQA/FUEL

2022.03.31

**සභාපති**
**ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

**සභාපති**
**ගමනාගමන මණ්ඩලය**

<u>**සංචාරක සේවා සපයන ආයතනය සදහා ඉන්ධන ලබාගැනීමේදී ප්‍රමුඛතාවය ලබාදීම.**</u>

මේ වනවිට රට මුහුණ දී ඇති ආර්ථික තත්වය හමුවේ එය යම් මට්ටමකින් හෝ මගහරවා ගැනීමට සංචාරක ක්ෂේත්‍රයෙන් ලැබෙන පිටිවහල ඉතා වැදගත්ය. එය විදේශ විනිමය මෙරටට ගෙන්වා ගැනීමට ලැබෙන ඉතා අනගි අවස්ථාවකි. 2022 ජනවාරි මස සිට මේ දක්වා සංචාරකයන් 280,000ක් පමණ ලංකාවට පැමිණ ඇත. ඒ අතරින් මෙම වසරේ වැඩිම සංචාරකයින් ප්‍රමාණය වන 103,922 ක් පැමිණ ඇත්තේ මෙම මාර්තු මාසයේදීයි. එයින් 50,000 කට අධික සංචාරකයින් සංඛ්‍යාවක් මේ වනවිට ලංකාවේ රැදී සිටිනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

ඒ අනුව ලංකාවේ ආර්ථික තත්වය ශක්තිමත් කිරීම සදහා විදේශ විනිමය මෙරටට ගෙන ඒමට එවන් කැපකිරීමක් හා දායකත්වයක් දක්වනු ලබන අපගේ සංචාරක කර්මාන්තයේ නියුතු නවාතැන් පහසුකම් සපයන ආයතන ආහාරපාන හා අනෙකුත් සේවා සපයන ආයතන වාගේම සංචාරක රියදුරු මාර්ගොපදේශකවරුන් හා සංචාරක රියදුරන් සදහා අවශ්‍ය පහසුකම් සලසා දීම මෙම අවස්ථාවේ ඉතා අත්‍යවශ්‍ය කාරණයක් වේ. එබැවින් අප ආයතනයේ ලියාපදිංචිය ලබා ඇති , සංචාරකයන් වෙතින් උපයන මුදලින් රජයට බදු ගෙවන මෙම ආයතන සදහා ඉන්ධන ලබා ගැනීමේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙතින් ප්‍රමුඛ පදනම මත එය ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

මේ සදහා ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ප්‍රමුඛතා අවසර පතක් ( Priority card ) අපගේ ලියාපදිංචි ආයතන , පුද්ගලයින් හා සංගම් වෙත ලබා දී ඇති අතර එහි පිටපතක් මේ සමග අමුණා එවමි. එය මාගේ අත්සනින් යුතුව , සංචාරක අමාත්‍යංශයේ ලේකම්තුමාගේ නිල මුද්‍රාව සහිතව නිකුත් කර ඇත.

මෙම කාඩ්පත රැගෙන එන අයගේ වාහන හා ජෙනරේටර් සදහා ඉන්ධන ලබාදීමේදී ඒ සදහා ප්‍රමඛතාව ලබා දීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කරදෙන ලෙස හා අදාල ඩිපෝ සහ ඉන්ධන පිරුවුම්හල් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා ඔබගේ දායකත්වය අපි ඉතා අගය කරමු.

ස්තුතියි,

අධ්‍යක්ෂ ජෙනරාල්,
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

පිටපත් :1- ලේකම් , සංචාරක අමාත්‍යාංශය
2 - ලේකම්, ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය
3 - ලේකම්, බලශක්ති අමාත්‍යාංශය
4 - පොලිස්පතිතුමා - උක්ත කරුණු සම්බන්දයෙන් අවශ්‍ය සහය ලබාදීම සඳහා සියලුම පොලිස් ස්ථාන වෙත මෙම පණිවිඩය දැනුම් දීමට කටයුතු කරන්නේ නම් මැනවි.
5- සාමාන්‍යාධිකාරී, ඛනිජතෙල් නීතිගත සංස්ථාව - අ.ක.ස.
6- අධ්‍යක්ෂ - පොලිස් සංචාරක කොට්ඨාසය සියලුම සංචාරක පොලිස් ස්ථාන වෙත දැනුම දීම සඳහා.

5397

# SLTDA
# REGISTERED

## ESTABLISHMENTS/ ASSOCIATIONS
## CHAUFFEUR GUIDES/ TOURIST DRIVERS

ලේකම්
සංචාරක අමාත්‍යාංශය
දෙවන මහල,

Secretary of Tourism

Director General
SLTDA